# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2182/37 - 2020 ජූලි මස 02 වැනි බ්‍රහස්පතින්දා - 2020.07.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2017 අංක 12 දරන විදේශ විනිමය පනත**

22 වන වගන්තිය යටතේ වූ නියමය

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ (පනත) 22 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මා විසින්, මෙම නියමය මගින්,

(i) 2017.11.17 දිනැති, අංක 2045/56 දරන *අති විශේෂ ගැසට් නිවේදනවල* පළ කරන ලද, 2017 අංක 1 දරන විදේශ විනිමය (බලයලත් වෙළෙඳුන් විසින් සිදු කරනු ලබන විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු) නියෝගවල 1 වන උපලේඛනයෙහි ප්‍රදනය කර ඇති පොදු අවසරය යටතේ ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් විසින් විදේශයන්හි ආයෝජන කිරීම සඳහා ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් හරහා පහත (අ) සිට (ඈ) දක්වා අවශ්‍යතාවයන් ඉටු වන බවට විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සෑහීමකට පත්වන ගෙවීම් හැර අනෙකුත් ගෙවීම්, අත්හිටවනු ලැබේ.

(අ) විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ ආයෝජකයා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකුගෙන් ලබාගත් විදේශ ව්‍යවහාර ණය මුදලක් මගින් මූල්‍යනය කිරීමට යෝජිත ආයෝජන;

(ආ) පනතේ හෝ අවලංගු කරන ලද විනිමය පාලන පනතේ විධිවිධානවලට අනුකූලව ආයෝජිත රටෙහි සමාගමක හෝ ශාඛා කාර්යාලයක දැනටමත් සිදු කරන ලද ආයෝජනයකට අදාළව එම රටෙහි පවතින නියාමන අවශ්‍යතාවක් සපුරාලීම සඳහා සිදු කරන අමතර ආයෝජනයක්;

(ඇ) ආයෝජිතයාගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා එ. ජ. ඩොලර් 20,000 ක උපරිමයක් දක්වා, පනතේ හෝ අවලංගු කරන ලද විනිමය පාලන පනතේ විධිවිධානවලට යටත්ව දැනටමත් විදේශයක සංස්ථාපිත/පිහිටුවා ඇති පාලිත සමාගම්වල හෝ ශාඛා කාර්යාලවල සුදුසුකම්ලත් නේවාසික සමාගම් විසින් සිදු කිරීමට නියමිත අමතර ආයෝජනයක්/අරමුදල් යෙදවීමක් (අදාළ පරිදි);

(ඈ) සුදුසුකම්ලත් නේවාසික සමාගම් විසින්, පනතෙහි හෝ අවලංගු කරන ලද පනතෙහි විධිවිධානවලට යටත්ව විදේශයක දැනටමත් පිහිටුවා ඇති සම්බන්ධීකරණ, අලෙවිකරණ, අනුයෝජිත, ව්‍යාපෘති, නියෝජිත හෝ වෙනත් ඕනෑම සමාන කාර්යාල නඩත්තු කිරීමේ අරමුණ සඳහා, එ.ජ. ඩොලර් 20,000 ක උපරිමයක් දක්වා සිදු කරන ප්‍රේෂණ.

1A - PG 5045 — 542 (2020/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ii) ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් විසින් දරනු ලබන ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හෝ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හරහා සිදු කරනු ලබන ඕනෑම ප්‍රමාණයක් දක්වා අනුමත ජංගම ගනුදෙනු සඳහා වන ප්‍රතිමුඛ ප්‍රේෂණ හෝ ඇ. එ. ජ. ඩොලර් 20,000 උපරිමයක් දක්වා ප්‍රාග්ධන ගනුදෙනු සඳහා වන ප්‍රතිමුඛ ප්‍රේෂණ හැර මෙම නියමය බලාත්මක වන කාලපරිච්ඡේදය අතරතුර අනෙකුත් ඕනෑම ප්‍රතිමුඛ ප්‍රේෂණ අත්හිටවනු ලැබේ;

(iii) 2017.11.17 දිනැති අංක 2045/56 දරන *අති විශේෂ ගැසට් නිවේදනවල* පළ කරන ලද 2017 අංක 1 දරන විදේශ විනිමය (බලයලත් වෙළෙඳුන් විසින් සිදු කරනු ලබන, විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු) නියෝගවල iv වන උපලේඛනයෙහි ප්‍රදානය කර ඇති පොදු අවසරය යටතේ දැනටමත් සංක්‍රමණික දීමනාවට හිමිකම් පා ඇති විගාමිකයන් විසින් ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම හරහා සංක්‍රමණික දීමනාව යටතේ අරමුදල් නැවත යැවීම මෙම නියමය බලාත්මක වන කාලපරිච්ඡේදය අතරතුර ඇ.එ.ජ. ඩොලර් 20,000 ක උපරිමයක් දක්වා සීමා කරනු ලැබේ;

(iv) සංක්‍රමණික දීමනාවට පළමුවරට හිමිකම් කියනු ලබන විගාමිකයන් සඳහා සුදුසුකම්ලත් සංක්‍රමණික දීමනාව ඇ.එ.ජ. ඩොලර් 30,000 ක උපරිමයක් දක්වා සීමා කරනු ලැබේ;

(v) 2017.11.17 දිනැති අංක 2045/56 දරන විශේෂ *ගැසට් නිවේදනවල* පළ කරන ලද 2017 අංක 1 දරන විදේශ විනිමය (බලයලත් වෙළෙඳුන් සිදු කරනු ලබන විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු) නියෝගවල 1 වන උපලේඛනයෙහි ප්‍රදානය කර ඇති පොදු අවසරයෙහි නිශ්චිතව දක්වා ඇති සීමාවන් ඉක්මවා යන ආයෝජන සඳහා, පහත අවස්ථාවලදී, එක් එක් ආයෝජනය මත පදනම්ව, විදේශ විනිමය පනතෙහි 7(10) වගන්තිය ප්‍රකාරව අවසර ලබා දීම සඳහා මුදල් මණ්ඩලයට බලය පවරනු ලැබේ.

(*අ*) විදේශ විනිමය පනතෙහි විධිවිධාන යටතේ අයෝජකයා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකුගෙන් ලබාගත් විදේශ ව්‍යවහාර ණය මුදලක් මගින් යෝජිත ආයෝජනය මූල්‍යනය කිරීම;

*හෝ*

(*ආ*) පනතේ හෝ අවලංගු කරන ලද විනිමය පාලන පනතේ විධිවිධානවලට අනුකූලව ආයෝජිත රටෙහි සමාගමක හෝ ශාඛා කාර්යාලයක දැනටමත් සිදු කරන ලද ආයෝජනයකට අදාළව එම රටෙහි පවතින නියාමන අවශ්‍යතාවක් සපුරාලීම සඳහා යෝජිත ආයෝජනයක් සිදු කිරීම.

මෙම නියමය, මෙම නියමයෙහි දින සිට මාස හයක කාලයක් සඳහා වලංගු වේ.

**මහින්ද රාජපක්ෂ**
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය

2020 ජූලි මස 02 වැනි දින,
කොළඹ දී ය.

07-438

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.